**ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල - 2021**

---------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ අංක 1321/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 23(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා අරමුදල විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව අරමුදල කටයුතු කර ඇති බව,

- අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති බන්ධිත වෙළුම 2020 - මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්ප රාමුවට අනුව, වාර්තාකරණ ආයතනයට අදාළ සියලුම වියදම් සහ වත්කම් හඳුනාගෙන වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, අර්ථසාධක අරමුදලට ඍජුවම අදාළ වන සමාලෝචිත වර්ෂය සඳහා වූ රු. 53,639,207 ක මෙහෙයුම් වියදම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෝ හෙළිදරව් කර නොතිබුණි. | 2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට) එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැත.<br>තවද, මෙම කරුණ 2021 පෙබරවාරි 11 වැනි දින සහ 2022 මැයි 26 දින පැවති ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කමිටුව විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැරීමේ වත්මන් පරිචය දිගටම කරගෙන යාමට තීරණය කර ඇත. මෙම කරුණ විස්තරාත්මකව සලකා බැලූ ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැරීමේ වත්මන් ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දී ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 7 සිට වසර 14 | අංක.3.3.3 සටහනට අනුව, "ප්‍රයෝජනවත් ආයු කාලය, සුන්බුන් වටිනාකම් සහ ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර යෝග්‍ය වන්නේ | පරිශීලකයන්ගේ අවබෝධය සඳහා අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| දක්වා වෙනස් කර තිබුණි. අරමුදලේ වාහන සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපුම් කිරීමක් ලෙස රු. මිලියන 3.6 ක් වූ ක්ෂයවීම්වලට සිදු වූ බලපෑම අතීතයට බලපාන පරිදි ගලපා තිබුණි. කෙසේ වෙතත්, මෝටර් වාහනවල ආයුකාලයේ වෙනස්වීම් සහ එහි ක්ෂය ප්‍රතිපත්තිය අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල අංක. 3.3.3 දරන සටහනේ නිසි පරිදි අනාවරණය කර නොතිබුණි. | නම් ගැලපීම් කරනු ලැබේ" යනුවෙන් සඳහන් වේ. අවශ්‍ය නම්, ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල අමතර තොරතුරු අනාවරණය කළ හැක. | |

## 1.6 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය හැර ගිය සහ ඉවත් කළ සාමාජිකයින්ට අයත් රු. 72,039,691 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුනු අතර එම මුදලින් රු. 63,032,304 ක් වසර හයකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුනි. | සාමාජිකයා අවසන් ගෙවීම සඳහා ලේඛන ඉදිරිපත් කළ යුතු අවම කාල සීමාවක් අරමුදලේ රීතිය මගින් නියම කර නැත. එබැවින්, අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන විට මෙම අරමුදල් නිදහස් කිරීමට අරමුදල තවමත් බැඳී සිටින අතර මූල්‍ය ප්‍රකාශනවලින් කපා හැරීමට නොහැක. | සේවය හැර ගිය සහ ඉවත් කරන ලද සාමාජිකයින්ගේ අවසන් ගෙවීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල් රෙගුලාසි | | | |
| | (i) රීතිය 4 - ඉපැයීම් | මෙම විධිවිධානයට පටහැනිව, අරමුදලට වන දායකත්වය ගණනය කිරීමේදී, ලංකා විදුලිබල මණ්ඩලය විසින් රඳවා ගැනීමේ දීමනාව, පශ්වාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව/අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතරින් ඉහළම දීමනාව ඉපැයීම් ලෙස හඳුනාගෙන තිබුණි. | අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී, 2007 ඔක්තෝබර් 23 දිනැති පුද්ගල චක්‍රලේඛ අංක: DGM(P)/Policy/GS(1)/181 අනුව ඒකාබද්ධ වැටුපට අමතරව, ඉහළම දීමනාව (රඳවා ගැනීමේ දීමනාව, පශ්වාත් උපාධි දීමනාව, වෘත්තීය දීමනාව සහ අර්ධ වෘත්තීය දීමනාව අතුරින්) සලකා බලා ඇත. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) රීතිය 22 - සාමාජිකයින්ට ලාභාංශ | • මෙම විධිවිධානයට පටහැනිව, පෙර වර්ෂය අවසන් වන දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවීම වෙනුවට සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට පැවති සාමාජිකයින්ගේ බැර ශේෂයන් මත පදනම්ව ලාභාංශ ගෙවා තිබුණි.<br>• මෙම විධිවිධානයට පටහැනිව, යම් වියදම් අඩු කිරීමට සහ සංචිත සඳහා වෙන්කිරීම් සිදු කිරීමට පෙර ආදායම මත ලාභාංශ ගණනය කර තිබුණි. | • විශ්‍රාම යන සාමාජිකයාගේ අවසන් වසරේ දායකත්වය සඳහා ලාභාංශ එකතු නොකරයි. එබැවින් රීතිය අංක 22 මගින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල වේ.<br>• සංචිත සහ වෙන්කිරීම් ඇති කිරීමෙන් පසුව සහ අරමුදලට අය කළ හැකි වියදම් අඩු කිරීමෙන් පසුව ලාභාංශ ගණනය කිරීම නිසි ලෙස සිදු කරයි. | අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (FR) | | | |
| (i) FR 454(1) | අරමුදල විසින් භාවිතා කරන ලද තොග අයිතම 42 කට අදාළ තොග වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | අරමුදල විසින් මිලදී ගන්නා සෑම තොග අයිතමයක්ම අරමුදලේ තොග ලේඛනයේ සටහන් කරන අතර සඳහන් කර ඇති තොග අයිතම 42 ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කර ඇත. එබැවින්, අරමුදලේ තොග ලේඛනයේ සටහන් කර නොමැත. නමුත් ඒවා ලංකා විදුලිබල මණ්ඩලයේ තොග ලේඛනයේ නිසි ලෙස සටහන් කර ඇත. | අරමුදල විසින් භාවිතා කරන සෑම තොග අයිතමයක් සඳහාම අරමුදල විසින් තොග වාර්තා පවත්වා ගත යුතුය. |
| (ii) FR 396 | 2021 ජනවාරි සිට ජුනි දක්වා ලියන ලද එකතුව රු. 5,605,806 වූ චෙක්පත් 2022 අගෝස්තු 31 දක්වා උපලබ්ධි වී නොතිබුණි. කෙසේ වෙතත්, වලංගු කාල සීමාව ඉකුත් වූ මෙම චෙක්පත් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පළමුව, ඔබගේ වාර්තාවේ දක්වා ඇති ඉදිරිපත් නොකළ චෙක්පත්වල එකතුව අපගේ වාර්තා සමඟ සමාන නොවන නමුත් රු. 4,378,257.94 ක් වූ චෙක්පත් පසුව ඉදිරිපත් කර ඇති අතර කල් ඉකුත් වූ ඉතිරි චෙක්පත් අවලංගු කිරීමට කටයුතු කරමින් සිටී. | විගණකගේ ලේඛනය බැංකු සැසඳුම් ප්‍රකාශනය සමඟ සමාන වන අතර මෙම සියලු චෙක්පත් 2022 අගෝස්තු දක්වා ඉදිරිපත් කිරීමක් හෝ අවලංගු කිරීමක් සිදු කර නොමැත.<br>එම නිසා, මුදල් රෙගුලාසිවලට අනුව ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,474,724,389 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 6,294,668,211 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 819,943,822 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට 2021 වර්ෂය තුළදී අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩි වීම සහ පොලී හා අනෙකුත් ආදායම් අඩු වීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| ආදායම/වියදම | 2021 | 2020 | වැඩිවීම / (අඩුවීම) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| පොලී ආදායම | 5,475,285,041 | 6,290,686,206 | (815,401,165) | (12.9) |
| අනෙකුත් ආදායම | 5,392,150 | 7,880,288 | (2,488,138,) | (31.57) |
| අනෙකුත් මෙහෙයුම් වියදම | 5,952,802 | 3,898,283 | 2,054,519 | 52.7 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා අරමුදලේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| අනුපාතය | 2021 % | 2020 % |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 85.26 | 84.61 |
| සාමාන්‍ය ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය | 8.44 | 10.62 |
| සාමාජිකයන්ගේ අරමුදල් ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය | 6.59 | 8.23 |

අරමුදලේ ශුද්ධ ලාභ අනුපාතය 2020 වසරේ පැවති සියයට 84.61 ට සාපේක්ෂව 2021 වසරේ සියයට 85.26 ක් ලෙස වාර්තා කර ඇත. කෙසේ වෙතත්, ආයෝජන පොලී අනුපාත අඩුවීම හේතුවෙන් සාමාන්‍ය ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 10.62 සිට සියයට 8.44 දක්වා අඩු වී ඇත. ආයෝජනවල ප්‍රතිලාභය අඩුවීම හේතුවෙන් සාමාජිකයින්ගේ අරමුදල් ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 8.23 සිට සියයට 6.59 දක්වා අඩු වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ වාර්තා කර ඇති රු. 2,157,483,000 ක් වූ ආයෝජනයෙන් ලැබිය යුතු මුදල් | වාර්තාවේ සඳහන් කර ඇති පරිදි නඩු කටයුතු සිදු වෙමින් පවතින අතර අරමුදලේ වාර්ෂික ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිපාදන | හිඟ ආයෝජන ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආපසු අයකර ගැනීමේ හැකියාව, එම මූල්‍ය උපකරණවලට අදාළ සාක්ෂි නොමැතිකම හේතුවෙන් සැක සහිත වූ අතර ප්‍රාථමික අලෙවිකරු (එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී) වෙතින් කිසිදු තහවුරු කිරීමක් ලැබී නොතිබුණි. තවද, එම සිද්ධියට අදාළව 2015 දෙසැම්බර් 09 වැනි දින එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය වෙත පැමිණිල්ලක් ගොනු කර තිබූ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සතු මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විසින් දිස්ත්‍රික් අධිකරණයේ අපරාධ නඩුවක් ගොනු කර තිබුණි. කෙසේ වෙතත්, එම නඩුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන් වී නොතිබුණි. | සලසමින් එකී ආයෝජන මත සිදුවන යම් හානිකරණ අලාභයකට එරෙහිව ආයෝජන සංචිතයක් නිර්මාණය කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට සංචිතය රු. 2,157,483,000 ක් විය.<br>තවද, එම ආයෝජනය සඳහා එහි මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී අයකර ගැනීම සඳහා අරමුදල විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු අංක: DMR/1405/2018 යටතේ සිවිල් නඩුවක් ආරම්භ කර ඇත. | |
| (ආ) | ලංකා විදුලිබල මණ්ඩලයේ ආරම්භයේ සිටම පවතින රු. 2,167,354 ක් වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සංචිතය නිසි අනුමැතියකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ දායකත්වය (සියයට 15) සහ සාමාජිකයින්ගේ දායකත්වය (සියයට 10) වෙත මාරු කර තිබුණි. | නව පද්ධති සැලසුම යටතේ, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ (PSPF) ශේෂය ලංකා විදුලිබල මණ්ඩලය (සියයට 15) සහ සාමාජික (සියයට 10) යන කාණ්ඩවලට පැවරීම අවශ්‍ය වූ අතර එමගින් වගකීමෙහි කිසිදු වෙනසක් සිදු නොවීය. එබැවින් අවශ්‍ය නම්, අරමුදලේ කළමනාකරණ කමිටුවෙන් ආවරණ අනුමැතිය ලබා ගත හැක. | සංචිතය පැවරීම සඳහා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය. |